මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව
மத்திய மாகாண சபையின் அரச சேவைகள் ஆணைக்குழு
**Public Service Commission of Central Provincial Council**

තැ.පෙ. 114, අංක 244, කටුගස්තොට පාර, මහනුවර
த.பெ. இல. 114, இல. 244, கடுகஸ்தொட்டை வீதி, கண்டி
P.O Box 114, No. 244, Katugasthota Road, Kandy.

**web site*: www.psc.cp.gov.lk***
**e-mail*: cpcpsc@yahoo.com***

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| කාර්යාලය<br>காரியாலயம்<br>Office | 081-2213097 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 081-2213096 | සහකාර ලේකම්<br>உதவி செயலாளர்<br>Asst. Secretary | 081-5631321 | ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | 081-2213082<br>081-2213097 |

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | සිපීසී/පීඑස්සී/9/6/1 | ඔබේ අංකය<br>உமது இல<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2016.07. |

මධ්‍යම පළාත් සභාවේ
ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාර ලේකම්,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
ආයතන ප්‍රධානීන් වෙත

**මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ 1 වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2014 (11) (2016)**

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් 2016.06.24 දිනැති අංක 1973 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මගින් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ 1 වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය-2014(II) (2016) සඳහා අයදුම්පත් කැඳවා ඇත.

02. ඒ අනුව, මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාව අනුව, ඔබ ආයතනයේ සේවය කරනු ලබන ඉහත විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලැබූ මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන්ගේ අයදුම්පත් අදාළ ගැසට් නිවේදනය අනුව හා ඇමුණුමෙහි ඇතුලත් ආදර්ශ අයදුම්පත්‍ර අනුව සකස් කර 2016.08.01 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් මෙම කොමිෂන් සභාව වෙත එවන මෙන් කාරුණිකව දන්වමි.

03. පළමුවරට මෙම විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතකුදු වුවත් ඉන්පසු වාරවලදී නිලධාරීන් විසින් එක්වර සම්පූර්ණ විභාගයට පෙනී සිටින්නේ නම් රු. 500/- ක්ද, විෂයන් දෙකක් සඳහා පෙනී සිටින්නේ නම් රු.400/- ක්ද, එක් විෂයක් සඳහා පෙනී සිටින්නේ නම් රු. 300/- ක්ද වූ විභාග ගාස්තුවක් මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැර වන ලෙස මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ලබා ගත් කුවිතාන්සිය අයදුම්පත්‍රයේ අදාළ ස්ථානයේ අලවා එවිය යුතු බවද කාරුණිකව දන්වමි. (නිවේදනයේ 8 ඡේදයේ සඳහන් පරිදි විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂයට විභාග ගාස්තු බැරවන ලෙස තැපැල්/ උපතැපැල් කාර්යාලයකට මුදල් ගෙවා ලබා ගන්නා ලදුපත් බාර ගනු නොලැබේ.)

04. අයදුම්පත්‍රයේ ඔබ අයත්වන සේවය “මධ්‍යම පළාත් රාජ්‍ය සේවය” හා “සංකේත අංකය- 02” ලෙස සඳහන් කිරීමට මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අයදුම්කරුවන් කටයුතු කළ යුතු අතර, ආදර්ශ අයදුම් පත්‍රය www.psc.cp.gov.lk වෙබ් අඩවියෙන් බාගත හැකිවේ.

ආර්.එම්.එන් රත්නායක
ලේකම්,
මධ්‍යම පළාත් සභාවේ
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

පිටපත - මධ්‍යම පළාතේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත - මෙම විභාග අයදුම්කරුවන් විසින් ගෙවනු ලබන විභාග ගාස්තුව මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැර වන ලෙස මුදල් අයකර ගැනීමට කටයුතු කරන්න

# මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව
# மத்திய மாகாண சபையின் அரச சேவைகள் ஆணைக்குழு
# Public Service Commission of Central Provincial Council

තැ.පෙ. 114, අංක 244, කටුගස්තොට පාර, මහනුවර
த.பெ. இல. 114, இல. 244, கடுகஸ்தொட்டை வீதி, கண்டி
P.O Box 114, No. 244, Katugasthota Road, Kandy.

web site: www.psc.cp.gov.lk
e-mail: cpcpsc@yahoo.com

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| කාර්යාලය<br>காரியாலயம்<br>Office | 081-2213097 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 081-2213096 | සහකාර ලේකම්<br>உதவி செயலாளர்<br>Asst. Secretary | 081-5631321 | ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | 081-2213082<br>081-2213097 |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | සීපීසී/පීඑස්සී/9/6/3 | ඔබේ අංකය<br>உமது இல<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2016.07. |

මධ්‍යම පළාත් සභාවේ
ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාර ලේකම්,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
ආයතන ප්‍රධානීන් වෙත

**<u>මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ 111 වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2012 (1) (2016)</u>**

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් 2016.06.24 දිනැති අංක 1973 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මගින් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය-2012(I) (2016) සඳහා අයදුම්පත් කැඳවා ඇත.

02. ඒ අනුව, මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාව අනුව, ඔබ ආයතනයේ සේවය කරනු ලබන ඉහත විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලැබූ මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරින්ගේ අයදුම්පත් අදාළ ගැසට් නිවේදනය අනුව හා ඇමුණුමෙහි ඇතුලත් ආදර්ශ අයදුම්පත්‍ර අනුව සකස් කර 2016.08.01 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් මෙම කොමිෂන් සභාව වෙත එවන මෙන් කාරුණිකව දන්වමි.

03. පළමුවරට මෙම විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතකුදු වුවත් ඉන්පසු වාරවලදී නිලධාරීන් විසින් එක්වර සම්පූර්ණ විභාගයට පෙනී සිටින්නේ නම් රු. 500/- ක්ද, විෂයන් දෙකක් සඳහා පෙනී සිටින්නේ නම් රු.400/- ක්ද, එක් විෂයක් සඳහා පෙනී සිටින්නේ නම් රු. 300/- ක්ද වූ විභාග ගාස්තුවක් මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැර වන ලෙස මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ලබා ගත් කුවිතාන්සිය අයදුම්පත්‍රයේ අදාළ ස්ථානයේ අලවා එවිය යුතු බවද කාරුණිකව දන්වමි. (නිවේදනයේ 8 ඡේදයේ සඳහන් පරිදි විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂයට විභාග ගාස්තු බැරවන ලෙස තැපැල්/ උපතැපැල් කාර්යාලයකට මුදල් ගෙවා ලබා ගන්නා ලදුපත් බාර ගනු නොලැබේ.)

04. අයදුම්පත්‍රයේ ඔබ අයත්වන සේවය "මධ්‍යම පළාත් රාජ්‍ය සේවය " හා "සංකේත අංකය - 02" ලෙස සඳහන් කිරීමට මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අයදුම්කරුවන් කටයුතු කල යුතු අතර, ආදර්ශ අයදුම් පත්‍රය www.psc.cp.gov.lk වෙබ් අඩවියෙන් බාගත හැකිවේ.

ආර්.එම්.එන් රත්නායක
ලේකම්,
මධ්‍යම පළාත් සභාවේ
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

පිටපත - මධ්‍යම පළාතේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත - මෙම විභාග අයදුම්කරුවන් විසින් ගෙවනු ලබන විභාග ගාස්තුව මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැර වන ලෙස මුදල් අයකර ගැනීමට කටයුතු කරන්න